සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | |
| විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I | |
| කාලය / காலம் / Time | පැය 01 | |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 03 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

(01) සහනාධාර බෙදා දීමේ දී ගම්වාසීන් අතර **ගිනි ඇවිළුණ නිසා** එම කටයුත්ත අතරමග නතර විය.

(1)ගින්නක් ඇති වීම නිසා (2) ආරවුලක් ඇති වීම නිසා
(3) තරගයක් ඇති වීම නිසා (4) සිත් තැවුල නිසා

(02) **ඉහ මොළ කන** මිනිසුන් සමාජයේ සිටින බව නායක හිමියෝ පැවසූහ.

(1) වැරදි වැඩ කරන (2) ඔළුව අවුල් කරන
(3) විනාශයට කටයුතු කරන (4) මොළය තුවාල කරන

(03) දෙමාපියෝ **එක සිතින්** තමන් සතු සියලු ම දේපළ දරුවන්ට බෙදා දුන්නෝ ය .

(1) සැකයකින් තොර ව (2) ඉතා සතුටින්
(3) එක සිතිවිල්ලෙන් (4) සැහැල්ලු ලෙස

- අංක 04 සිට 06 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

(04) ......................................සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයෙන් භාෂා කුසලතා හා ව්‍යවහාර ඥානය වර්ධනය කර ගත හැකි බව විද්වත්හු පවසති.

(1) සංවිධිත (2) සංකීර්ණ (3) සංගෘහිත (4) සම්භාව්‍ය

(05) ප්‍රේක්ෂකයන් තුළ ආකර්ෂණය ඇති වන අයුරින් නාට්‍ය පිටපත් සකස් කිරීම......................... කාර්යයකි.

(1) අභියෝගාත්මක (2) අවිවාදාත්මක
(3) අවියෝජනීය (4) අනපේක්ෂිත

(06) නව තාක්ෂණික ඉගෙනුම් ආධාරක භාවිත කිරීමෙන් විෂය කරුණු ඉතා හොඳින් සිසුන් වෙත .................................. කළ හැකි ය.

(1) සංවරණය (2) සම්ප්‍රේෂණය

(4) සංකලනය (4) විශ්ලේෂණය

(07) සියලු ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි පද පේළිය තෝරන්න.

(1) අවිනෂ්ය, විලාශය, සුපේසල, විශ්මිත

(2) අභිරූපණ, දෘෂ්ටාන්ත, දෘෂ්ටිය, සමස්ත

(3) පරිවර්ථනය, සූර්යා, ප්‍රස්ථාවනාව, සම්භාරය

(4) පෘෂ්ඨය, සිත්කළු, කෘශ්ණ, ප්‍රහන්ධ

(08) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) කැප්පෙටිපොළ, කරවනැල්ල, කරන්දෙණිය, කඩුගන්නාව

(2) නාන්නේරිය, නාත්තණ්ඩිය, නාවලපිටිය, නවගමුව

(3) මීනුවන්ගොඩ, රත්මලාන, හම්බන්තොට, හික්කඩුව

(4) තම්මැන්නාව, තමන්කඩුව, තණමල්විල, තබ්බෝව

(09) එක් එක් පදයේ දෙවන අක්ෂරයේ දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, කෙටිපාපිල්ල, ඇදපිල්ල පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ආරූඪ, සමාප්තිය, තරුණයා, මියැසිය

(2) අකුසලය, උරුමය, කතිරය, අවාරය

(3) නපුරු, අකුටිල, සීමිත, කුරුසිය

(4) වික්‍රමය, පිනැති, විධානය, තඹුරු

(10) උක්ත නාම පද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගායකයෙකු, ඔවුන්, නුඹලා, කෙනෙකු (2) හෙතෙම, ඕ, තොපි, ඔවුහු

(3) සමහරු, අප, මම, ඇතමුන් (4) දැරියක්, මා, අපි, මැණියෝ

(11) නිරුක්ත + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සෑදෙන නිවැරදි පදය තෝරන්න.

(1) නිරුක්තික (2) නෛරුක්තික

(3) නෙරුක්තික (4) නෞරුක්තික

(12) A - ඔහු කාර්යාලයෙන් පිට විය.

B -බොහෝ නගර සිතුවම්වලින් අලංකාර කර ඇත.

C -ළමයි වීරයන් ලෙස වැඩ කළෝ ය.

D - සිංහයෝ ගුහාවල ජීවත් වෙති.

ඉහත වාක්‍ය වලින් කරණ හා ආධාර විභක්තිවලට පිළිවෙළින් අයත් වන්නේ ,

(1) A හා C ය. (2) A හා B ය.

(3) D හා A ය. (4) B හා D ය.

.(13) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නො වන පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - ඉසුරුමත්, ප්‍රියතම, වීර්යවන්ත, ප්‍රාථමික

(2) කෘදන්ත - කැපුණු, ගැයිලි , සදත, රඟන

(3) උපසර්ග - විපුල, නිර්භය , දූර්මත, අපහරණ

(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා - සාදවයි , ලියවයි , ගයවයි , දුවවයි

(14) අනුරූප යන පදය අයත් වන්නේ ,

(1) විශේෂණ සමාසයට ය. (2) විභක්ති සමාසයට යි.

(3) අව්‍යය සමාසයට යි. (4) අන්‍යාර්ථ සමාසයට යි.

◆අංක 14 සිට 16 දක්වා ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(15) වර්තමාන සිංහල පද්‍ය සාහිත්‍යය භාවපූර්ණ සුනිශ්ශිත එකක් බව විචාරකයෝ පවසති.

(1) හැඟීම්වලින් සපිරුණු (2) රසයෙන් සපිරුණු

(3) අර්ථයෙන් පිරුණු (4) වින්දනයෙන් යුක්ත

(16) බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියෝ ප්‍රතිචීන භාෂා පිළිබඳ විශාරදයෙක් වූහ.

(1) පෙරදිග (2) අපරදිග (3) ස්වදේශීය (4) විදේශීය

(17) රටේ පවතින නීති රීති අතික්‍රමණය සමාජයේ පරිහානියට හේතු වේ.

(1) අනවබෝධය (2) ඉක්මවා යෑම

(3) නො සලකා හැරීම (4) සොයා නො බැලීම

(18) දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.

(1) පතෝල, වැටකොළු, බෝංචි, කරවිල (2) මාල, වළලු, මුදු, කරාබු

(3) අච්චාරු, අලුවා, තෝසෙ, කිරිබත් (4) නියන, කියත, අඬුව, මිටිය

(19) එක් එක් පද පේළියේ සමානාර්ථ යෙදුම් පමණක් ඇති පද පේළිය තෝරන්න.

1. රම්භා - කෙසෙල්, ඉඳුවර -මානෙල්, පණිඳා-නාගයා, සව් -සියලු
2. කෘෂ්ණ-නපුරු, නිදන- දූදන, ෂඩ්- අට, වස්නිය- වර්ෂාව
3. සුනඛ-සිගාල, අජ-ගව, මිග-සිංහ, රිටුන්-කොවුලන්
4. පහණ-පාෂාණ, සූකර- වඳුරු, කිවිසුරු - දක්ෂ, තුදුස -දොළහ

(20) මුලින් දී ඇති පදයේ සමානාර්ථ නො දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඖෂධ - ඔසු, බෙහෙත් , භෙසජ්ජ , බෙහෙද

(2) දෙරණ - පොළොව, මහී , පඨවි , මිහි

(3) රන් - කාංචන, කසුන් , හේම, ස්වර්ණ

(4) විෂ්ණු - උවිඳු, පුරඳුරු , නාරායණ, ගොවිඳු

(21) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.

(1) සංයෝජනය - සංකලනය (2) පැණසර - අනුවණ

(3) සාර්ථක - නිරර්ථක (4) ආගාරික - අනාගාරික

(22) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න .

(1) 'ගැයෙයි' යනු වර්තමාන කාල කර්තෘකාරක ක්‍රියාවකි.

(2) ව්‍යඤ්ජන ශබ්දයකට පසුව යෙදෙන 'ය' ශබ්දය වෙනුවට යංශය යෙදේ.

(3) ඌෂ්මාක්ෂර සර්ෂ නමින් ද හඳුන්වනු ලැබේ.

(4) අක්ෂර මාලාවේ ඇති ඣ ඤ අක්ෂර බැඳි අකුරු නො වේ.

(23) සෑම වචනයක ම කණ්ඨජ අක්ෂරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) සහනය,තරුණ,උචිත,භූමිය (2) වරය,ඡත්‍රය,ජවය,ධනය

(3) මහාර්ඝ,මේඛලා,මාර්ගය,කතිරය (4) මුහුණ,පවන,ඥානය,අෂ්ට

(24) ඔ, ඕ,ඖ අක්ෂර අයත් අක්ෂර කාණ්ඩය වන්නේ

(1) කණ්ඨ තාලුජ ය. (2) දන්ත ඕෂ්ඨජ ය.

(3) දන්ත තාලුජ ය. (4) කණ්ඨ ඕෂ්ඨජ ය.

(25) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ස්ථාන නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) ති, නා, රි, න්, ලේ (2) ග, ක, න, ත, ර, ම

(3) රි, වෙ, ගි, ස්, ය, ස (4) ප,දී, නා, ල, ග

(26) A - දිනිසුරු - පූර්වස්වර ලෝප සන්ධිය

B - ගංතෙර - ද්විත්ව රූප සන්ධිය

C - පූජෝපහාර - ස්වරාදේශ සන්ධිය

D - බුදුකුරු - පරරූප සන්ධිය

ඉහත A,B,C,D අතුරින් නිවැරදි වන්නේ

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා D පමණි (4) B පමණි

◆අංක 26 හා 27 යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

(27) ඒදණ්ඩ මැද දී අත්වැල කැඩුණා වගේ

(1) පිහිටට සිටි අය හදිසියේ නැති වීම

(2) අතරමග දී විපතක් සිදුවීම

(3) හදිසි අවදානමකට මුහුණ පෑම

(4) අනුන්ගෙන් උදව් ලබා ගැනීමට ගොස් අමාරුවේ වැටීම

(28) දුවන්ට ඇරලා වල්ගේ අල්ලනවා වගේ

(1) ඉතා අමාරු කාර්යයක් කිරීම

(2) යමක් ගැන සුදුසු වෙලාවේ උනන්දු නොවී බොරු උනන්දුවක් දැක්වීම

(3) උත්සාහයෙන් අරමුණ ඉටු කර ගැනීම

(4) ඉතා පහසුවෙන් විසඳුම් සොයා ගැනීම

◆අංක 29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල** ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(29) (1) ලේඛකයන් තිදෙනෙක් සාහිත්‍ය උත්සවයේ දී සම්මාන ලබා ගත්හ.

(2) අපි සෞඛ්‍ය උපදෙස් පිළිපැදිය යුතු ය.

(3) වෙළෙන්දන් වැඩි මිලට භාණ්ඩ විකුණති 'යි පාරිභෝගිකයෝ පවසති .

(4) ඔවුන් දක්ෂ නීතිඥයෝ වෙති.

(30) (1) විදේශවල සිටි ශ්‍රී ලාංකික සිසුන් ආපසු පැමිණ ඇත.

(2) සාමාජිකයෝ කැටුව නිලධාරීහු රැස්වීමට පැමිණියෝ ය.

(3) ඔහු දක්ෂ කථිකයෙක් මෙන් කතා කළේ ය.

(4) ජනාධිපතිතුමා විසින් ඇමතිවරු පත් කරන ලදී.

(31) මුල් පදයේ පමණක් අර්ථයක් පෙන්වන යුගල පද සහිත වරණය තෝරන්න.

(1) හීනදීන, ගුටිබැට, දුගීමගී, ගල්මුල්

(2) කොට්ටමෙට්ට, මැහුම්ගෙතුම්, නැටුම්ගැයුම්, වැටකඩුලු

(3) ණයතුරුස් , උදවුපදවු, ඉඩම්කඩම්, නහිනදෙහින

(4) එහාමෙහා, උස්පහත්, අහසපොළොව, අගමුල

(32) A- කෝවිඩ් 19 රෝගය නිසා සෞඛ්‍ය පහසුකම් ............................... රජයට විශාල වියදමක් දැරීමට සිදු වී ඇත.

B- වැසි සමයේ ඩෙංගු මදුරුවන් බෝවන ................................ අවට පරිසරය පිරිසිදු කළ යුතු ය.

C- දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ................................. දෙමාපියන් විශේෂ අවධානය යොමු කළ යුතු බව ගුරුවරු පවසති.

D- ණය පහසුකම් ලබා දීමේ දී අඩු ආදායම් ලාභීන් ...............................සැලකිලිමත් වන ලෙස ඇමතිතුමා පැවසුවේ ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ කුමක් ද?

E -බැවින් , F - පිළිබඳ , G - වෙනුවෙන්, H - කෙරෙහි

: (1) G,H,E,F (2) G,E,F, H (3) E,F,G,H, (4),H,F,G,E

(33) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය කුමක් ද?

අපි ඔක්කොම ලෙඩවලින් පරිස්සම් වෙන්න ඕන.

(1) අපි සියල්ලෝ ම රෝගවලින් ආරක්ෂා විය යුතු ය.

(2) අපි සියල්ලන් ම රෝගවලින් ආරක්ෂා විය යුතු ය.

(3) අපි සියල්ලෝ ම රෝගවලින් ආරක්ෂා විය යුත්තෝ ය.

(4) අපි සියල්ලෝ ම රෝගවලින් ආරක්ෂා විය යුත්තෙමු.

(34) රූපකයක් රහිත පිළිතුර තෝරන්න.

(1) පහන් බවින් පිටතට සස ලෙසින් වත

(2) බසේ කිලිටිකම නැණ සිලිලෙන් දොවනා

(3) මිහිඳුම් සළුතිර පැලඳි නමුණුකුල

(4) භවේ අඳුර නැසු මිණි පහන යි

(35) ''අකාරණයේ කකුල් කළකුරුවා නො ඇවිද මොබ එ'යි වදාළ හැ.''

ඉහත ගද්‍ය පාඨයේ ඇති ''කළකුරුවා'' යන වචනයේ අර්ථය කුමක් ද?

(1) වෙහෙසට පත් කර
(2) තුවාල නො කර
(3) හකුළා ගෙන
(4) වෙවුලමින්

:(36) පහත සඳහන් කවියේ තුන්වන පද්‍ය පාදය තෝරන්න.

''රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
පාන්දරට යන්තම් ඇස පියෙන්නේ
..........................................................................
හීනෙන් ඇවිත් නැනා අත වනන්නේ

(1) එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ

(2) හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ

(3) දෙගොඩ හරිය ගෙවිලා පිනි වැටෙන්නේ

(4) දෙගොඩ ගොඩින් නුඹ කොතැන ද සිටින්නේ

(37) A- කුකුළු හැවිල්ල - සැහැලි පද්‍ය

B- හෙයියම් මාරුව - සිරි ගුණසිංහ

C- ඔතෙලෝ - විලියම් ශේක්ෂ්පියර්

D-වතුර මල - ඇරැව්වල නන්දිමිත්‍ර

A B C D ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) B හා C ය. (2) A හා D ය. (3) B හා D ය. (4) A, C හා D ය.

(38) සබරගමු උපභාෂාවේ ''**කුරුවෙ රාජකාරිය**'' ලෙස හඳුන්වන්නේ,

(1) හේන් කෙටීම (2) අලි ඇල්ලීම (3) ගොවිතැන් කිරීම (4) ගව පාලනය

(39) ස පෙ ක් එකකු කැව නසිනේ ඔහු ම වද
අ නෙ ක් ලොවින් නො නැසෙයි සතෙකුත් එක ද
ප ස ක් දුදන පබු කන මුව ළං කළ ද
ව ග ක් නැසෙයි වැනසෙයි එමතු ද ඔහු ද

ඉහත කවියෙන් ප්‍රකාශ වන්නේ,

(1) බොරු කීමෙන් වන විනාශය යි. (2) කේලාම් කීමෙන් වන විනාශය යි.

(3) නරක මිතුරන් ඇසුරෙන් වන විනාශය යි. (4) සත්ත්ව හිංසාවෙන් වන විනාශය යි.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් **සමීප අදහස** දෙන වරණය තෝරන්න.

පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනයට වඩා රාජ්‍ය බලය පෙන්වීමේ අවස්ථාවක් වූ බව පැරණි වාර්තා පිරික්සීමේ දී පෙනී යන කරුණකි.

(1) පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනයත් රාජ්‍ය බලය පෙන්වීමත් ප්‍රධාන කොට පවත්වා ඇත.

(2) පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් පවත්වා ඇත.

(3) පැරණි වාර්තාවලට අනුව අතීතයේ දළදා පෙරහැර පවත්වා ඇත්තේ රාජ්‍ය බලය පෙන්වීම සඳහා ය.

(4) පැරණි වාර්තාවලට අනුව දළදා පෙරහැර පවත්වා නැත.

(ල. 40 × 1 = 40 යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) මෙම පත්‍රය සඳහා නියමිත ලකුණු ගණන 80 කි.

(01) අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල වර්ණ මාලාවේ ඇතුළත්
(අ) මිශ්‍ර ස්වරයක්
(ආ) අන්තඃස්ථ අක්ෂරයක් බැගින් ලියන්න.

(ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.
(අ) ඇද්දළ (ආ) කොස්සින්න

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ත්‍යාග ප්‍රධානෝත්සවයේ දී මෙතෙක් පැවති තරඟ සියල්ලට ම සහතික පත්‍ර පිරිනැමුණි.

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.
වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ඔහු මානව හිතවාදී අපූර්ව මිනිසෙකි.

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) කම්පාව (ආ) පූර්වභාග

(vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) අතීත ක්‍රියා කලාපයන් යළි යළිත් සිහිපත් කිරීම
(ආ) නැවත නැවතත් අභ්‍යාසයේ යෙදීම

(vii) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නො ගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) සමුද්‍ර ගොස (ආ) කල්‍යාණ දහම්

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) ඇතැම් මිනිස්සු ගුණමකුවෝ සේ හැසිරෙති.
(ආ) වෛද්‍යවරු නොහොත් හෙදිය රෝගීන් සුවපත් කළේ ය.

(ix) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද වර්ග නම් කරන්න.
(අ) දරුවන්ගේ සුරතල් **බලා** දෙමාපියෝ තුටු වෙති.
(ආ) සිසුන් **පැමිණෙත් ම** පාසල දොඩමලු විය.

(x) පහත දැක්වෙන ප්‍රාදේශික ව්‍යවහාරයන්හි පොදු ව්‍යවහාර ලියන්න.
(අ) බෝල්ලු (ආ) පතහ

(ලකුණු 2 x 10 = 20 යි)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන වචන **250කට නො අඩු වන සේ** රචනයක් ලියන්න.වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ ව වෙනදාට වඩා අවධානයක් යොමු වී ඇති බව පෙනෙයි. අප රටේ ම වගා කළ හැකි භෝග වර්ග ගණනාවක් තිබිය දී පිටරටවල් කෙරෙහි විශ්වාසය තබාගෙන සිටීම අනුවණ ක්‍රියාවකි. කවර තත්ත්වයක් යටතේ වුව ද අපට වගා කළ හැකි සෑම තැනක ම පරිභෝජනයට අවශ්‍ය එළවළු,පලතුරු සහ වෙනත් භෝග වර්ග වගා කිරීම සඳහා යොමු වීම ජනතාවගේ වගකීමකි.

(ආ) ලෝකය පුරා ම ජනතාව වසංගතයක ගොදුරු බවට පත් වී ඇති අන්දම අදහා ගැනීමටවත් බැරි තරම් ය. අදූරදර්ශී ක්‍රියාවන්හි ප්‍රතිඵල නිසා සමස්ත ලෝකය ම සදාකාලික අඳුරෙහි ගිලෙන කාලය වැඩි ඈතක නො වේ. තවමත් අපගේ නාසය මත්තෙන් වතුර ගලා නො යන බැවින් විනාශය වැළැක්වීමේ පියවර, ඒවා පිළිබඳ සැලසුම්, තොරතුරු සංවිධානය, පාලනය ආදී ක්‍රම පිළිබඳ ව අප තවදුරටත් අවධානය යොමු කළ යුතු ය.

(ඉ) පුද්ගල හැකියාවන් හා ශක්තීන් වර්ධනය කිරීම අධ්‍යාපනයේ එක් අරමුණකි. එමගින් රටටත් සමාජයටත් පුද්ගලයා බරක් නො වේ. දැනුම ලබා ගැනීම එහි එක් අංගයකි. නමුත් ක්‍රියාකාරී ව රටේ සංවර්ධනයට දායක වන ජනතාවක් බිහි කිරීමට රටේ සංවර්ධන ක්‍රියාවලිය හා අධ්‍යාපනය ඒකාබද්ධ කළ යුතු වේ. ඒ සඳහා විෂයමාලා සකස් කිරීමේ කාර්යයේදී වැඩි අවධානයක් යොමු විය යුතු ය.

(ඊ) දේශීය සම්පත් උපයෝගී කර ගෙන නව නිපැයුම් බිහි කිරීම පිළිබඳ අවධානය අද වෙනදාටත් වඩා දැනෙන්නට පටන් ගෙන ඇත.ශ්‍රී ලංකාව පමණක් නො ව ලෝක වෙළෙඳපොළ පවා ආකර්ෂණය කළ හැකි නව නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු විය යුතු ය. ඒ සඳහා උචිත ක්‍රියා මාර්ග කෙබඳු දැයි සොයා බලා ඒවා දිරිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම කඩිනම් කළ යුතු ය.

(ලකුණු 25 යි)

(03) පහත දැක්වෙන පාඨය **වචන 65-75 අතර වන සේ** සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

වෘද්ධ බව ලබන අපගේ ලේ ඥාතීන් ක්‍රමයෙන් වියපත් වෙද්දී ඔවුන් ශාරීරික මානසික සෞඛ්‍යයෙන්, ආර්ථිකයෙන්, සුරක්ෂාවෙන්, බාහිර ලෝකයෙන් මදින් මද දුරස්වීම ස්වාභාවික දහමක් බව නිතර සිහියට ගැනීම අපට මදිකමක් නො වේ. නූතන කාර්යබහුල සමාජ ක්‍රමය තුළ අප අවිවේකී කරවා ඇතත් දැනට අප ලබා ඇති මේ සියල්ල අපට උරුම කර දීමේ පෙර ගමන්කරුවන් වන්නේ අපේ වැඩිහිටියන් බව අමුතුවෙන් නො කිව මනා ය. ඊට අනුව සිතන පුද්ගලයා සිය ගඳ සුවඳ දැනෙන මානයේ ම වැඩිහිටියන් රඳවා ගෙන ඇප උපස්ථානයෙන්, සුරක්ෂාවෙන් සෙනෙහසින් ඔවුන් දෙස බලන්නට පෙළඹෙයි. එවිට ඔහු සිය යුතුකම් ද වගකීම් ද ඉටු කළා වන්නේ ය. සන්නිවේදනයත් සමග ලෝකය කුඩා වීම නිසා බටහිරින් දක්නා අසනා ශෛලීන් අපගේ ද හිත්වලට රිංගා ගැනීම දැන් සිදු වී ඇත. ආර්ථික සෞභාග්‍යය පිළිබඳ පිපාසයත්, රන් කහවනු පිළිබඳ උන්මාදයත්, අවිවේකී ජීවන රටාවත් නිසා වැඩිහිටියා වැඩිහිටි නිවාසයේ ලැගුම් ගන්වන්නට බොහෝ දෙනා පෙළඹෙන්නේ එහෙයිනි.

වැඩිහිටි නිවාසවල රැඳෙන්නෝ එකිනෙකාට පෙර පුරුදුකම් ඇත්තෝ නො වෙති. ඔවුන් අතර හටගන්නේ කෙටි කාලීන ඇලීම් බැඳීම් මිස මානව ඥාති ප්‍රේමයක බැම්මක් නො වේ. තම ලේ ඥාතීත්වයෙන් ගිලිහී තාවකාලික ලැගුම්පොළවල සිටින්නා මිනිසා අතර ම අසරණයෙකු බවට පත් වේ. මෙය කවුරුන් කළත් ඥාතිත්වය කෙළෙසීමේ පාප කර්මයේ හවුල්කරුවන් බවට පත් වේ. වෘද්ධයාගේ මූලික මානසික අවශ්‍යතාව වන්නේ දරුවන් ඇසුරේ ඔවුන්ගේ හඬ ඇසෙන මානයේ විසීම මිස අන් කිසිවක් නො වන බවට අපට නියත අවබෝධය එන්නේ අප ද වයස්ගත වූ කල්හි ය. මේ නිසා එළඹෙන කවර තත්ත්වයක් යටතේ වුව ද සිය වෘද්ධ ඥාතීන් තමන් වෙත ම තම නිවෙස්වල ම රඳවා ගැනීමත්, ඔවුන් පිළිබඳ ව සොයා බලා ආදරය සෙනෙහස පෑමත්, සුරක්ෂාව දීමත් කළ යුතු ව ඇත. එය මගහැරීම සඳහා නිදහසට කරුණු ඉදිරිපත් කරන්නට අවශ්‍ය නො වේ.

(ලකුණු 10 යි)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

මිනිසුන් ගෝත්‍ර ලෙස වාසය කරන අවධියේ දී පවා ගහකොළවලට කොතරම් ආදරය කළා ද යන වග ජනප්‍රවාද කතාවලින් අපට දැනගත හැකියි. ගහකොළ දෙවිවරුන් වශයෙන් සලකා තිබූ බව 'අයියනායක' වැනි කවි පන්ති මගින් තහවුරු වේ. ගෙවල් සෑදීම සඳහා මුලින් ම කෝටු උපයෝගී කර ගත් බවත් වී බිස්ස , වී අටුව වැනි ආහාර භෝග වර්ග ගබඩා කර ආරක්ෂා කර ගැනීමට ද ප්‍රවාහන මාධ්‍ය වශයෙන් ද ලීවලින් සාදන ලද පාරු ද උපයෝගී කර ගැනීම ආදී කාලීන මිනිසා සිදු කර ඇති බවටත් සාක්ෂ්‍ය ඇත.මේ හැරුණු විට රජවරුන් රට පාලනය කළ කාල වකවානුවල සියලු ම ඉඩම්වල අයිතිය රජු සතු බවත්, රජුන් විසින් නින්දගම් ලබා දුන් අය රජුට බදු වශයෙන් එහි සේවය කර ඇති බවත් පැරණි පොත්පත්වල සඳහන් ය. නමුත් එම නින්දගම් සඳහා එම ජනතාවට හිමිකමක් හෝ පවරා ගැනීමේ බලයක් නො තිබුණි. මහාවංශයේ සඳහන් පරිදි එකල වනය සම්බන්ධ නීති රීති ද තිබුණු බවත් එකිනෙකාට අවශ්‍ය පරිදි වනය එළි කිරීම හා ගස් කැපීම රජුන් විසින් නීතියෙන් තහනම් කර තිබූ බවත් එහි දැක්වේ. එකොළොස්වන හා දොළොස්වන සියවස්වල විදේශීය ආක්‍රමණ වළක්වා ගැනීම සඳහාත්, මුහුදු තරණය කිරීම සඳහාත්, දැවවලින් තැනූ රුවල් නැව් යොදා ගත් බව ද ඉතිහාස ග්‍රන්ථවල සඳහන් ය. මෙනයින් බලන කළ ගහකොළ හා මිනිසා අතර ඇත්තේ අවියෝජනීය බැඳීමක් බව අප අවිවාදයෙන් පිළිගත යුතුයි.

(1) අයියනායක පද්‍ය පන්තිය මගින් තහවුරු වන කාරණය ලෙස මෙහි දක්වා ඇත්තේ කුමක් ද?

(2) ඡේදයට අනුව ආහාර භෝග ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ගත් ලීවලින් සෑදූ මෙවලම් දෙකක් නම් කරන්න.

(3) රාජාණ්ඩු පැවති වකවානුවල ඉඩම් සම්බන්ධයෙන් පොත්පත් වල සඳහන් කරුණු මොනවා ද?

(4) මහාවංශයේ දැක්වෙන පරිදි නීතියෙන් තහනම් කරන ලද්දේ කුමක් ද?

(5) මෙහි සඳහන් පරිදි රුවල් නැව් යොදා ගත්තේ කුමන කාර්යයක් සඳහා ද?

(ලකුණු 2×5-10 යි)

(05) මුළු මහත් ලෝකය ම කම්පාවට පත් කරමින් පැතිර යන මාරාන්තික වසංගතයක් පිළිබඳ ව දැන් අපගේ ද අවධානය යොමු වී ඇත. ඒ පිළිබඳ ව ශ්‍රී ලාංකික ජනතාව දැනුම්වත් කරමින් එහි අවදානම පිළිබඳ ව සිහි ගන්වමින්, ආරක්ෂා වීමේ ක්‍රමවේද සඳහන් කරමින් පොදුවේ බෙදා හැරීම සඳහා ආකර්ෂණීය අත් පත්‍රිකාවක් සකස් කරන්න. (වචන 100-125 ත් අතර සෑහේ)

නැතහොත්,

'මහසෙන්පුර' නිරතුරු ව වන අලි උවදුරට මුහුණ දෙන ගම්මානයකි. එහි පවුල් 25ක් පමණ ජීවත් වෙති. බොහෝ කාලයක පටන් මේ උවදුර නිසා මිනිසුන්ගේ ජීවිත මෙන් ම දේපළවලට ද සිදුවන හානිය ගණනය කළ නොහැකි තරම් ය. එනිසා වන අලි මෙරටට සම්පතක් කර ගැනීමේ උපක්‍රම පැහැදිලි කරමින් ගම්මානය වටා ශක්තිමත් අලි වැටක් ඉදිකර දීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සභාපතිතුමා වෙත යැවීමට සුදුසු රාජකාරි ලිපියක් සකස් කරන්න. මහසෙන්පුර ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම්වරයා ඔබ යැයි සිතන්න. ( මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

11 ශ්‍රේණිය - සිංහල භාෂාව හා සාහිත්‍ය

II පත්‍රය

නිල් පත

| ප්‍රශ්න අංක | දැනුම | අවබෝධය | භාවිතය | සංස්ලේෂණයය | විශ්ලේෂණය | ඇගයීම |
|---|---|---|---|---|---|---|
| 1. i අක්ෂර මාලාව | ✓ | | ✓ | | | |
| ii සන්ධි | ✓ | | ✓ | | | ✓ |
| iii අක්ෂර වින්‍යාසය | ✓ | | | ✓ | | |
| iv උපසර්ග | ✓ | | | | | |
| v විරුද්ධාර්ථ පද | ✓ | | | | | |
| vi තනිපදය | ✓ | | | ✓ | | |
| vii තත්සම තත්භව | ✓ | ✓ | ✓ | | | |
| viii විශේෂ වාක්‍ය | ✓ | | ✓ | | | |
| ix ක්‍රියා පද | ✓ | | ✓ | ✓ | ✓ | |
| x යුගල පද | ✓ | ✓ | ✓ | | | |
| 2. රචනාව අ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ආ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඉ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ඊ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 3. සාරාංශය | ✓ | | | | | |
| 4. අවබෝධය - 1 | ✓ | ✓ | | | | |
| - 2 | ✓ | ✓ | ✓ | | | |
| - 3 | ✓ | ✓ | ✓ | ✓ | | |
| - 4 | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| - 5 | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 5. ප්‍රායෝගික ලේඛණය - i | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 5. ප්‍රායෝගික ලේඛණය - ii | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

මෙය අවසාන නැත

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: III | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

(i) උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

(ii) අංක 1 , 2 , 3 , 4 ප්‍රශ්නවලටත් 5,6,7, ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

(iii) මෙම පත්‍රය සඳහා නියමිත ලකුණු ගණන 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''තෝ කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් ද ?''

(අ) මෙසේ කීවේ කවරෙක් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය රචනා වූ යුගය ලියන්න.

(ii) බැඳි දන මන වැයුමෙහි ඇදුරෝයා
විඳි සත්සර වෙණ සර මදුරෝයා
රැඳි සතොසින් සැනහුණු ඉඳුරෝයා
........................................................................

(අ) මෙහි අවසාන පද්‍ය පේළිය ලියන්න.

(ආ) වෙණ සර යන්නෙහි අර්ථය ලියන්න.

(iii) ''... පුත මා විසින් කුමක් කළ මනා ද?...''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

(ආ) මෙහි 'පුත 'යනුවෙන් ඇමතුම් ලැබුවේ කවුරුන් ද?

(iv) (අ) ගැමියා විවේකය දනුම්වත්කමින් හා විනෝදයෙන් ගත කිරීමට යොදා ගත් ජනකවි විශේෂය නම් කරන්න.

(ආ) ජාතික වීර කාව්‍යයක් බවට පත් වී තිබෙන එස්. මහින්ද හිමියන් විසින් රචිත කෘතිය කුමක් ද?

. (v) ''...එහෙයින් දුන් ඈට ද කොයි මග ගියත් එක ය ...''

(අ) මෙහි 'ඈ 'යනු කවරෙක් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතියේ අනුවර්තකයා නම් කරන්න.

(vi) (අ) ජපානයෙන් පිරිනමන ලද ස්වර්ණ රජත සම්මානයෙන් පිදුම් ලැබූ නිර්මාණකරුවා නම් කරන්න.

(ආ) රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහයේ නම ලියන්න.

(vii) (අ) ''අඟුල්මල් දමනය''අමාවතුර කෘතියේ කී වැනි පරිච්ඡේදයේ ඇතුළත් වේ ද ?

(ආ) ඡන්දස් ශාස්ත්‍රයට අදාළව අධ්‍යයනය කෙරෙන පැරණි සිංහල ග්‍රන්ථය කුමක් ද?

(viii) ''හිම සරි සිහිල් දිය හෙබ දක යන් මිතුර ''

(අ) මෙම පද්‍ය පාදය ඇතුළත් පද්‍ය ග්‍රන්ථයේ රචකයා නම් කරන්න.

(ආ) එතුමා විසින් රචිත වෙනත් කෘතියක නම ලියන්න.

(ix) ''කෙසේ වුවද මෙය මට ම තනිකර තබා ගැනීමට තරම් බර වැඩි අත්දැකීමක් විය ''

(අ) මෙම ගද්‍ය ඛණ්ඩය ඇතුළත් මුල් කෘතියේ නම ලියන්න.

(ආ) මෙහි බර වැඩි අත්දැකීම වූයේ කිනම් කරුණක් ද?

(x) පහත දැක්වෙන නිර්මාණකරුවන් හැඳින්වූ අන්වර්ථ නාම ලියන්න.

(අ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

(ආ) එච්.එම්. කුඩලිගම

(ලකුණු 02×10 - 20 යි)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ගනේ මිණි බැබළි කිරණෙ 'ව් **සතපාය**
රනේ යට'ග සැවුලිඳු දද ගළපාය
අනේ ලකර කළ පුර අප **නරපාය**
පෙනේ දකුණු මහසෙන් දෙව් රද පාය

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙහි දෙවන පේළියේ අර්ථය ලියා දක්වන්න.

(ii) ''... එක් දවසක් අඟුල්මල් මහතෙරහු පෙරවරු පා සිවුරු ගෙනැ සැවැත් නුවර වැදැ <u>**සපදන්සැරි**</u> වන බැවින් ගෙපිළිවෙළින් කෙණෙසි අහර සිඟන්නාහු මූඪගර්භ වැ නො වැදිය හෙන <u>**මාගමක**</u> දැකැ කරුණායෙන් කම්පිත වූහු...''

(අ) අංකිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම සම්පූර්ණ පාඨයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iii) හෙට ඉදි වන නව ලෝකය දැක දැක
පුංචි පුතා හීනෙන් හිනැහෙයි

(අ) මෙහි ඇතුළත් කාව්‍යාලංකාරය නම් කරන්න.

(ආ) පද්‍ය පාදයේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

(iv) ''...ඒ දොළ දුන් මුදුන් පැමිණියේ ය. එබැවින් සත් දවසක් සැණකෙළි කෙළුව යි නුවර බෙර ලවා තමන් වහන්සේ මාලිගයේ මතු මහලේ අමාත්‍ය මණ්ඩලය පිරිවරා හිඳ මහා සන්තෝෂයෙන් මත් වැ ජය පානය බොන සේක් යැයි'' කීහ.

(අ) මුදුන් පැමිණියා යැයි පැවසූ ඒ දොළ කුමක් ද?

(ආ) මෙහි 'තමන් වහන්සේ' යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?

(v) සැප සයනා සුවඳ බොජුන්
තුමුල මාලිගා
ඈ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නේ

(අ) මෙසේ ප්‍රශ්න කරන්නේ කවුරුන් ද?

(ආ) මෙය ශ්‍රවණය කළ අයගෙන් මීට ලැබුණු පිළිතුර කුමක් ද?

(ලකුණු 4 × 5 = 20 යි)

(03) (අ) සංවාදශීලි බස් වහරත්

(ආ) සංක්ෂිප්ත භාෂා ලක්ෂණත්

හේතුවෙන් 'අමාවතුර' ඉතා විශිෂ්ට ගණයේ නිර්මාණයක් ලෙස අගය කළ හැකි වේ. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්,**

සැළලිහිණි සන්දේශය තත්කාලීන සමාජයේ ,

(අ) සමාජ හා ආර්ථික තොරතුරුත්

(ආ) දේශපාලන වශයෙන් පැවති තත්ත්වයත්

අනාවරණය කරන කාව්‍ය සංග්‍රහයකි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(04) (අ) තම උරුමය සොයා වෙහෙසෙන්නා වූත්,

(ආ) අධිෂ්ඨානශීලී වූත්,

තරුණයෙකු 'සිංහබාහු' නාට්‍යයේ සිංහබාහුගේ චරිතයෙන් මනාව පිළිබිඹු වේ.පෙළ පොතේ පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(අ) රට වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමත්

(ආ) තම චරිතය යහපත් ලෙස ගොඩනැගීමට අවශ්‍ය උපදෙස් ලබා දීමත්

හේතුවෙන් 'මුනි සිරිපා සිඹිමින්නේ' පද්‍ය පන්තිය සුවිශේෂී පද්‍ය පන්තියක් ලෙස අගය කළ හැකි වේ. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් තහවුරු කරන්න.

(ලකුණු 15 යි)

- 05, 06, 07 ප්‍රශ්නවලින් **එකකට** පමණක් පිළිතුරු ලියන්න.

(05) 'අතීතයේ කෘෂිකර්මාන්තයේ යෙදුණු ගැමියා මුහුණ දුන් විවිධ බාධක ජය ගැනීමට ඔහු දැරූ වෙහෙස කුරහන් කවි මගින් ප්‍රකාශ වේ.' අදාළ පාඩමෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(06) 'දියමන්ති මාලය කෙටිකතාවේ මැටිල්ඩාගේ චරිතය සජීවී ලෙස නිරූපණය කිරීමට කතුවරයා ගත් උත්සාහය සාර්ථක වී ඇත.' උදාහරණ තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න.

(07) 'ස්වභාව සෞන්දර්යයෙන් අනූන කැරගල ගම්පියස පිළිබඳ ව කියැවෙන කැරගල වැනුම සරල වූත් අව්‍යාජ වූත් පද්‍ය නිර්මාණයකි.' උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

:

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11
විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය
පත්‍රය / வினாத்தாள் / Paper: පිළිතුරු

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

| | | | | |
|---|---|---|---|---|
| 1-2 | 11-2 | 21-1 | 31-3 | |
| 2-3 | 12-4 | 22-1 | 32-2 | |
| 3-1 | 13-2 | 23-3 | 33-4 | |
| 4-4 | 14-3 | 24-4 | 34-1 | |
| 5-1 | 15-1 | 25-3 | 35-1 | |
| 6-2 | 16-2 | 26-2 | 36-2 | |
| 7-2 | 17-2 | 27-1 | 37-4 | |
| 8-3 | 18-3 | 28-2 | 38-2 | |
| 9-1 | 19-1 | 29-3 | 39-2 | |
| 10-3 | 20-4 | 30-1 | 40-3 | (ලකුණු 40 × 1- 40 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

(01)

(i) (අ) ඓ / ඖ (ආ) ය/ර/ල/ව

(ii) (අ) ඇත් + දළ (ආ) කොස් + ඉන්න

(iii) (අ) ප්‍රදානෝත්සවයේ (ආ) තරග

iv) (අ) පරිසමාප්ත (ආ) අපූර්ව

v) (අ) අකම්පාව (ආ) අපරභාග

vi) (අ) ප්‍රත්‍යවේක්ෂණය/ අතීතාවර්ජනය (ආ) සතතාභ්‍යාසය

vii) (අ) සමුද්‍රඝෝෂ/සමුදුරු ගොස (ආ) කල්‍යාණ ධර්ම / කලණ දහම්

viii) (අ) ඇතැම් මිනිස්සු ගුණමකුවන් සේ හැසිරෙති.

(ආ) වෛද්‍යවරු නොහොත් හෙදිය රෝගීන් සුවපත් කළාය.

ix) (අ) පූර්ව ක්‍රියා (ආ) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා/ අසම්භාව්‍ය ක්‍රියා

(x) (අ) මීහරක් (ආ) වගාළිං

(ලකුණු 2×10- 20)

(02) රචනාව සඳහා ලකුණු ප්‍රදානය

- ★ සාරවත්භාවය මාතෘකාව ද ඇතුළුව ල 08 යි
- ★ සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ල 12 යි
- ★ ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම ල 05 යි

මුළු ලකුණු 25 යි

(03) සාරාංශය සඳහා ලකුණු ප්‍රදානය

- ★ අන්තර්ගතය ල 06 යි
- ★ වචන ප්‍රමාණය ල 02 යි
- ★ ශිල්පීය දක්ෂතාව ල 02 යි

මුළු ලකුණු 10 යි

අන්තර්ගත විය යුතු ප්‍රධාන අදහස්

- ★ අපගේ ලේ නෑයෝ වෘද්ධ බව ලබන විට දුබල වෙති.
- ★ අප දනට භුක්ති විඳින සියලු වරප්‍රසාද ඔවුන්ගේ මහන්සියේ ප්‍රතිඵලයෝ වෙති.
- ★ ඒ බව අවබෝධ කර ගත්තෝ තම වැඩිහිටියන්ගේ සුරක්ෂිත බව පිළිබඳව තමා සතු වගකීම් ඉටු කරති.
- ★ තම සමීපතම වෘද්ධයන් වැඩිහිටි නිවාසවලට ගාල් කරන්නේ අකෘතඥයන් ය.එහි දී ඔවුන් ගත කරන්නේ තෘප්තිමත් ජීවිතයක් නො වේ.එම පාප කර්මයට හවුල් වන්නේ ඔවුන්ගේ ම අයිතිකරුවන් ය.
- ★ වැඩිහිටියන් මානසික සුවයක් ලබන්නේ තම හිතෛෂීන් සමග ගෙවන ජීවිතය තුළිනි.
- ★ අප ද කවදා හෝ එම තත්ත්වයට පැමිණෙන නිසා අපගේ වැඩිහිටියන් අප ඇසුරේ ම තබා ගනිමින් උපස්ථාන කළ යුතුයි.

(ලකුණු 10 යි)

(04) (1) ගහකොළ දෙවිවරුන් වශයෙන් සලකා තිබූ බව

(2) වී බිස්ස/ වී අටුව

(3) සියලුම ඉඩම්වල අයිතිය රජු සතුයි . නින්දගම් ලබා දුන් අය රජුට බදු වශයෙන් එහි සේවය කර ඇත.

(4) එකිනෙකාට අවශ්‍ය පරිදි වනය එළි කිරීම හා ගස් කැපීම

(5) විදේශීය ආක්‍රමණ වළක්වා ගැනීමට සහ මුහුදු තරණය කිරීමට

(ලකුණු 2×5-10 යි)

(05) ප්‍රායෝගික ලේඛන

- ★ ආකෘතිය ල. 05 යි
- ★ අන්තර්ගතය ල. 07 යි
- ★ ශිල්පීය දක්ෂතා ල. 03 යි

මුළු ලකුණු ල. 15 යි

## පිළිතුරු පත්‍රය - III

(01) i (අ) විද්දත් දුව (ආ) දඹදෙණි යුගය

ii (අ) වැදි දන සිරි ගත්තුය කිඳුරෝ ය (ආ) වීණා නාදය / වෙණ නද

iii (අ) උම්මග්ග ජාතකය/පන්සිය පනස් ජාතක පොත

(ආ) මහෞෂධ පණ්ඩිවරයා

iv (අ) තේරවිලි කවි/දෑනමුතු කමට කී කවි (ආ) ජාතික තොටිල්ල හෙවත් දරුනැළවිල්ල

v (අ) පුංචි මැණිකා (ආ) ඒ.පී ගුණරත්න

vi (අ)එදිරිවීර සරච්චන්ද්‍ර (ආ) බිය නොවන් අයියන්ඩි

vii (අ)හත්වැනි (ආ) එළු සදැස් ලකුණ

viii (අ) වීදාගම මෛත්‍රී හිමි/වීදාගම මෛත්‍රය හිමි

(ආ) බුදුගුණ අලංකාරය/ලෝවැඩ සඟරාව/දහම් ගැට මාලාව/එළු අත්තනගලු වංශය/ කව් ලකුණු මිණිමල

ix නොනිමි සිත්තම හා තවත් කෙටිකතා/ වැසිකිළිය පාවිච්චි කිරීම.

x ෂට්භාෂා පරමේශ්වර / සිංහල ෂෙලී

(ලකුණු 2×10-20)

(02) i. (අ) හිරු යන්නට සමාන අර්ථයක්

රජුගේ මාලිගය / ප්‍රාසාදය

(ආ) රත්තරනින් කළ යෂ්ටි අග කුකුළු රාජයන්ගේ රුව සහිත කොඩි බැඳ /සවි කොට ඇත.

ii. (අ)නිවෙස් අනුපිළිවෙළින් පිණ්ඩපාතය වැඩම වීම/ ස්ත්‍රියක යන අර්ථය දෙන පද

(ආ) දවසක් අංගුලිමාල මහ තෙරුන් වහන්සේ පෙරවරුවේ පාත්‍ර හා සිවුරු ගෙන සැවැත් නුවරට පැමිණ නිවෙස් අනුපිළිවෙළින් පිණ්ඩපාතයට වඩින බැවින් ගේ පිළිවෙළින් හැන්දක් අහර පිණ්ඩපාතය කිරීමට යන්නා වූ විට නිසි ලෙස දරුවා බිහි නොවී (බඩෙහි හරහට ගැබ පිහිටි) දරුවා ප්‍රසූත කරන්නට නොහැකිව සිටින ස්ත්‍රියක දුක කරුණාවෙන් කම්පනයට පත්ව ......

(iii) (අ) අනුප්‍රාසය

(ආ) අනාගතයේ දී ගොඩ නගන්නා වූ සංවර්ධිත රටක්, අලුත් ලොවක් දකිමින් පුංචි පුතා හීනෙන් හිනැහෙන බව.

(iv) (අ) නගරය සතුරන් වට කළ අවස්ථාවක උත්සවයක් සැණකෙළියක් පැවැත්වීම.

(ආ) වෛදේහ රජු.

(v) (අ) සිංහබාහු

(ආ) මේ සියල්ල හැර දා ඔබ පියාණන් සමඟ විසීමට මම කැලයට පැමිණියෙමි. (පද්‍යයක් වුව සෑහේ.)

(03) (අ) සංවාදශීලි බස්වහර

උදා: ★ හර්ග බමුණා මා කොසොල් රජු අතර සංවාදය

★ දිසාපාමොක් හා සෙසු සිසුන් අතර සංවාදය

★ දිසාපාමොක් හා අහිංසක අතර සංවාදය

★ බුදුන් වහන්සේ හා අඟුල්මල් සොරු අතර සංවාදය

★ කොසොල් රජු හා බුදුන් වහන්සේ අතර සංවාදය

(ආ) සංක්ෂිප්ත භාෂා ලක්ෂණ

උදා: නො බව/වත්සපනැ/ගණනුදු නො දත

වග වග ව යෙහි/ තො කෙසේ සිටියෙහි/ මම් කිසෙ

නොසිටියෙහි/ හෙ මැ ඔහට පැවිජි වි/ අස්හු වල්අස් වෙති

දෙපිත් මවුනට සෙත් වී /බර මුසී/ එයින් එ වී

(අ) සමාජ ආර්ථික තොරතුරු

උදා: 4 සන්නන් සිහින් කෙඳි සෙවණ ලු වැලි තෙලෙන

9 කස්තුරි සුවඳ සැදි නළලත සුමටාන

10 මල්දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි

(ආ) දේශපාලන තොරතුරු

උදා: 5 නිල තුරඟුට නගමින් රිවිදෙව් සිරින

6 අධිරාවණ වුවත් නවතන රිසින් එන

(04) (අ) උදා: ★ මට ද හිමි වේ වංග රාජ්‍යය - ප්‍රබල නරවර පරපුරෙන්

★ යන්ට දූන්නම් කාලෙ වේ...

★ උරුවේ අපගේ සොයමිනා

★ වංග දේසේ වෙසෙන ජනතා

කෙරෙහි වේ මා යුතුකමා

★ අප දෙදෙනා හට උරුම ජීවිතය මෙය නොවේ.

(ආ) ★ ඔබ දෙදෙනා මා සමග

නොආවොත් යන්ට වේ.

★ සපල කර ගත නොහැක

ජිවිතේ මේ ලෙසේ

★ මා පිය මිහිදා කරනා විකුමන්

ඇයි මට බැරි වන්නේ

(අ) උදා:-

★ නිදහස මහ මුහුදක් වේ

★ යුතුකම ඉටු කළ යුතු වේ

★ තමන් ලැබූ දිවි පෙවෙතේ - කොටසක් රට සමය වෙතේ

★ ඉටු කොට කළ යුතු යුතුකම්

★ ජාතිය රන් විමනක් වේ.

එය රැක ගන්නට මෙලොවේ.

(ආ) ★ කාටත් හිමි පොදු දේ නම් - නැති බැරි හිඟ අවහිරකම්

★ මිතුරු කමින් පෙරට එතොත්

★ සිනිඳු මොළොක් බව මලෙහී

(05) උදා :- ★ දුරුදු මහේ දී කැලයට වැදිලා

★ මා කී දේ දෙයියනි බොරුවක් ම නැති

★ හේනේ පැලේ මා විදිනා සුරුක්කන්

★ කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවේ

(06) විවාහය පිළිබඳ ආකල්පය.

★ සෑහීමකට පත් නො වන කාන්තා චරිතයක් වීම.

★ රන් ආභරණ කෙරෙහි ලොල් වීම.

★ සුන්දර ලෙස සිටීමට ආශා කිරීම.

★ අභියෝග හමුවේ දිරිමත් ව කටයුතු කිරීම.

7. (අ) උදා. ★ සාර පලය අඹ දඹ රඹ ද වල්පිට (1 කවිය)

★ කුළින් කුළට සිහිල 'ඹ වැහෙන කඳුරුය (2 කවිය)

★ නුදුරුවැ සිහිලැ' ලීය ගඟුලැ ලීය (8 කවිය)

★ පවන 'ද පිපි තුරේය නිරතුරේ ය (9 කවිය)

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍ර සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk
online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW
Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers



සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 03 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

(01) සහනාධාර බෙදා දීමේ දී ගම්වාසීන් අතර **ගිනි ඇවිළුණ නිසා** එම කටයුත්ත අතරමග නතර විය.

(1) ගින්නක් ඇති වීම නිසා (2) ආරවුලක් ඇති වීම නිසා
(3) තරගයක් ඇති වීම නිසා (4) සිත් තැවුල නිසා

(02) **ඉහ මොළ කන** මිනිසුන් සමාජයේ සිටින බව නායක හිමියෝ පැවසූහ.

(1) වැරදි වැඩ කරන (2) ඔළුව අවුල් කරන
(3) විනාශයට කටයුතු කරන (4) මොළය තුවාල කරන

(03) දෙමාපියෝ **එක සිතින්** තමන් සතු සියලු ම දේපළ දරුවන්ට බෙදා දුන්නෝ ය .

(1) සැකයකින් තොර ව (2) ඉතා සතුටින්
(3) එක සිතිවිල්ලෙන් (4) සැහැල්ලු ලෙස

- අංක 04 සිට 06 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

(04) ......................................සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයෙන් භාෂා කුසලතා හා ව්‍යවහාර ඥානය වර්ධනය කර ගත හැකි බව විද්වත්හු පවසති.

(1) සංවිධිත (2) සංකීර්ණ (3) සංගෘහිත (4) සම්භාව්‍ය

(05) ප්‍රේක්ෂකයන් තුළ ආකර්ෂණය ඇති වන අයුරින් නාට්‍ය පිටපත් සකස් කිරීම......................... කාර්යයකි.

(1) අභියෝගාත්මක (2) අවිවාදාත්මක
(3) අවියෝජනීය (4) අනපේක්ෂිත

(06) නව තාක්ෂණික ඉගෙනුම් ආධාරක භාවිත කිරීමෙන් විෂය කරුණු ඉතා හොඳින් සිසුන් වෙත .................................. කළ හැකි ය.

(1) සංවරණය (2) සම්ප්‍රේෂණය
(4) සංකලනය (4) විශ්ලේෂණය

(07) සියලු ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි පද පේළිය තෝරන්න.

(1) අවිනෂ්ය, විලාශය, සුපේසල, විශ්මිත
(2) අභිරූපණ, දෘෂ්ටාන්ත, දෘෂ්ටිය, සමස්ත
(3) පරිවර්ථනය, සූර්යා, ප්‍රස්ථාවනාව, සම්භාරය
(4) පෘෂ්ඨය, සිත්කළු, කෘශ්ණ, ප්‍රභන්ධ

(08) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) කැප්පෙටිපොළ, කරවනැල්ල, කරන්දෙණිය, කඩුගන්නාව
(2) නාන්නේරිය, නාත්තණ්ඩිය, නාවලපිටිය, නවගමුව
(3) මීනුවන්ගොඩ, රත්මලාන, හම්බන්තොට, හික්කඩුව
(4) තම්මැන්නාව, තමන්කඩුව, තණමල්විල, තබ්බෝව

(09) එක් එක් පදයේ දෙවන අක්ෂරයේ දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, කෙටිපාපිල්ල, ඇදපිල්ල පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ආරූඪ, සමාප්තිය, තරුණයා, මියැසිය
(2) අකුසලය, උරුමය, කතිරය, අවාරය
(3) නපුරු, අකුටිල, සීමිත, කුරුසිය
(4) වික්‍රමය, පිනැති, විධානය, තඹුරු

(10) උක්ත නාම පද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගායකයෙකු, ඔවුන්, නුඹලා, කෙනෙකු (2) හෙතෙම, ඕ, තොපි, ඔවුහු
(3) සමහරු, අප, මම, ඇතමුන් (4) දැරියක්, මා, අපි, මැණියෝ

(11) නිරුක්ත + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සෑදෙන නිවැරදි පදය තෝරන්න.

(1) නිරුක්තික (2) නෛරුක්තික
(3) නෙරුක්තික (4) නෞරුක්තික

(12) A - ඔහු කාර්යාලයෙන් පිට විය.

B -බොහෝ නගර සිතුවම්වලින් අලංකාර කර ඇත.

C -ළමයි වීරයන් ලෙස වැඩ කළෝ ය.

D - සිංහයෝ ගුහාවල ජීවත් වෙති.

ඉහත වාක්‍ය වලින් කරණ හා ආධාර විභක්තිවලට පිළිවෙළින් අයත් වන්නේ ,

(1) A හා C ය. (2) A හා B ය.
(3) D හා A ය. (4) B හා D ය.

.(13) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නො වන පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - ඉසුරුමත්, ප්‍රියතම, වීර්යවන්ත, ප්‍රාථමික

(2) කෘදන්ත - කැපුණු, ගැයිලි , සදත, රඟන

(3) උපසර්ග - විපුල, නිර්භය , දුර්මත, අපහරණ

(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා - සාදවයි , ලියවයි , ගයවයි , දුවවයි

(14) අනුරූප යන පදය අයත් වන්නේ ,

(1) විශේෂණ සමාසයට ය. (2) විභක්ති සමාසයට යි.

(3) අව්‍යය සමාසයට යි. (4) අන්‍යාර්ථ සමාසයට යි.

◆අංක 14 සිට 16 දක්වා ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(15) වර්තමාන සිංහල පද්‍ය සාහිත්‍යය භාවපූර්ණ සුනිශිත එකක් බව විචාරකයෝ පවසති.

(1) හැඟීම්වලින් සපිරුණු (2) රසයෙන් සපිරුණු

(3) අර්ථයෙන් පිරුණු (4) වින්දනයෙන් යුක්ත

(16) බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියෝ ප්‍රතිචීන භාෂා පිළිබඳ විශාරදයෙක් වූහ.

(1) පෙරදිග (2) අපරදිග (3) ස්වදේශීය (4) විදේශීය

(17) රටේ පවතින නීති රීති අතික්‍රමණය සමාජයේ පරිහානියට හේතු වේ.

(1) අනවබෝධය (2) ඉක්මවා යෑම

(3) නො සලකා හැරීම (4) සොයා නො බැලීම

(18) දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.

(1) පතෝල, වැටකොළු, බෝංචි, කරවිල (2) මාල, වළලු, මුදු, කරාබු

(3) අච්චාරු, අලුවා, තෝසෙ, කිරිබත් (4) නියන, කියත, අඬුව, මිටිය

(19) එක් එක් පද පේළියේ සමානාර්ථ යෙදුම් පමණක් ඇති පද පේළිය තෝරන්න.

1. රඹ - කෙසෙල්, ඉඳුවර -මානෙල්, පණිඳා-නාගයා, සව් -සියලු
2. කෘෂ්ණ-නපුරු, නිදන- දුදන, ෂඩ්- අට, වර්ෂිය- වර්ෂාව
3. සුනඛ-සිගාල, අජ-ගව, මිග-සිංහ, රිටුන්-කොවුලන්
4. පහණ-පාෂාණ, සූකර- වඳුරු, කිවිසුරු - දක්ෂ, තුදුස -දොළහ

(20) මුලින් දී ඇති පදයේ සමානාර්ථ නො දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඖෂධ - ඔසු, බෙහෙත් , භෙසජ්ජ , බෙහෙද

(2) දෙරණ - පොළොව, මහී , පඨවි , මිහි

(3) රන් - කාංචන, කසුන් , හේම, ස්වර්ණ

(4) විෂ්ණු - උවිඳු, පුරදුරු , නාරායණ, ගොවිඳු

(21) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.

(1) සංයෝජනය - සංකලනය (2) පැණසර - අනුවණ

(3) සාර්ථක - නිරර්ථක (4) ආගාරික - අනාගාරික

(22) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න .

(1) 'ගැයෙයි' යනු වර්තමාන කාල කර්තෘකාරක ක්‍රියාවකි.

(2) ව්‍යඤ්ජන ශබ්දයකට පසුව යෙදෙන 'ය' ශබ්දය වෙනුවට යංශය යෙදේ.

(3) ඌෂ්මාක්ෂර සර්ෂ නමින් ද හඳුන්වනු ලැබේ.

(4) අක්ෂර මාලාවේ ඇති ඩ ඤ අක්ෂර බැඳි අකුරු නො වේ.

(23) සෑම වචනයක ම කණ්ඨජ අක්ෂරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) සහනය,තරුණ,උචිත,භූමිය (2) වරය,ඡත්‍රය,ජවය,ධනය

(3) මහාර්ඝ,මේඛලා,මාර්ගය,කතිරය (4) මුහුණ,පවන,ඥානය,අෂ්ට

(24) ඔ, ඕ,ඖ අක්ෂර අයත් අක්ෂර කාණ්ඩය වන්නේ

(1) කණ්ඨ තාලුජ ය. (2) දන්ත ඕෂ්ඨජ ය.

(3) දන්ත තාලුජ ය. (4) කණ්ඨ ඕෂ්ඨජ ය.

(25) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ස්ථාන නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) ති, නා, රි, න්, ලේ (2) ග, ක, න, ත, ර, ම

(3) රි, වෙ, ගි, ස්, ය, ස (4) ප,දී, නා, ල, ග

(26) A - දිනිසුරු - පූර්වස්වර ලෝප සන්ධිය

B - ගංතෙර - ද්විත්ව රූප සන්ධිය

C - පූජෝපහාර - ස්වරාදේශ සන්ධිය

D - බුදුකුරු - පරරූප සන්ධිය

ඉහත A,B,C,D අතුරින් නිවැරදි වන්නේ

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා D පමණි (4) B පමණි

◆අංක 26 හා 27 යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

(27) ඒදණ්ඩ මැද දී අත්වැල කැඩුණා වගේ

(1) පිහිටට සිටි අය හදිසියේ නැති වීම

(2) අතරමග දී විපතක් සිදුවීම

(3) හදිසි අවදානමකට මුහුණ පෑම

(4) අනුන්ගෙන් උදව් ලබා ගැනීමට ගොස් අමාරුවේ වැටීම

(28) දුවන්ට ඇරලා වල්ගේ අල්ලනවා වගේ

(1) ඉතා අමාරු කාර්යයක් කිරීම

(2) යමක් ගැන සුදුසු වෙලාවේ උනන්දු නොවී බොරු උනන්දුවක් දැක්වීම

(3) උත්සාහයෙන් අරමුණ ඉටු කර ගැනීම

(4) ඉතා පහසුවෙන් විසඳුම් සොයා ගැනීම

◆අංක 29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල** ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(29) (1) ලේඛකයන් තිදෙනෙක් සාහිත්‍ය උත්සවයේ දී සම්මාන ලබා ගත්හ.

(2) අපි සෞඛ්‍ය උපදෙස් පිළිපැදිය යුතු ය.

(3) වෙළෙන්දන් වැඩි මිලට භාණ්ඩ විකුණති 'යි පාරිභෝගිකයෝ පවසති .

(4) ඔවුන් දක්ෂ නීතිඥයෝ වෙති.

(30) (1) විදේශවල සිටි ශ්‍රී ලාංකික සිසුන් ආපසු පැමිණ ඇත.

(2) සාමාජිකයෝ කැටුව නිලධාරීහු රැස්වීමට පැමිණියෝ ය.

(3) ඔහු දක්ෂ කථිකයෙක් මෙන් කතා කළේ ය.

(4) ජනාධිපතිතුමා විසින් ඇමතිවරු පත් කරන ලදී.

(31) මුල් පදයේ පමණක් අර්ථයක් පෙන්වන යුගල පද සහිත වරණය තෝරන්න.

(1) හීනදීන, ගුටිබැට, දුගීමගී, ගල්මුල්

(2) කොට්ටමෙට්ට, මැහුම්ගෙතුම්, නැටුම්ගැයුම්, වැටකඩුලු

(3) ණයතුරුස් , උදවුපදවු, ඉඩම්කඩම්, නහිනදෙහින

(4) එහාමෙහා, උස්පහත්, අහසපොළොව, අගමුල

(32) A- කෝවිඩ් 19 රෝගය නිසා සෞඛ්‍ය පහසුකම් ............................... රජයට විශාල වියදමක් දැරීමට සිදු වී ඇත.

B- වැසි සමයේ ඩෙංගු මදුරුවන් බෝවන ................................ අවට පරිසරය පිරිසිදු කළ යුතු ය.

C- දරුවන්ගේ අධ්‍යාපන කටයුතු .................................. දෙමාපියන් විශේෂ අවධානය යොමු කළ යුතු බව ගුරුවරු පවසති.

D- ණය පහසුකම් ලබා දීමේ දී අඩු ආදායම් ලාභීන් ................................සැලකිලිමත් වන ලෙස ඇමතිතුමා පැවසුවේ ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ කුමක් ද?

E -බැවින් , F - පිළිබඳ , G - වෙනුවෙන්, H - කෙරෙහි

: (1) G,H,E,F (2) G,E,F, H (3) E,F,G,H, (4),H,F,G,E

(33) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය කුමක් ද?

අපි ඔක්කොම ලෙඩවලින් පරිස්සම් වෙන්න ඕන.

(1) අපි සියල්ලෝ ම රෝගවලින් ආරක්ෂා විය යුතු ය.

(2) අපි සියල්ලන් ම රෝගවලින් ආරක්ෂා විය යුතු ය.

(3) අපි සියල්ලෝ ම රෝගවලින් ආරක්ෂා විය යුත්තෝ ය.

(4) අපි සියල්ලෝ ම රෝගවලින් ආරක්ෂා විය යුත්තෙමු.

(34) රූපකයක් රහිත පිළිතුර තෝරන්න.

(1) පහන් බවින් පිටතට සස ලෙසින් වත

(2) බසේ කිලිටිකම නැණ සිලිලෙන් දොවනා

(3) මිහිඳුම් සළුතිර පැලඳි නමුණුකුල

(4) භවේ අඳුර නැසු මිණි පහන යි

(35) ''අකාරණයේ කකුල් කළකුරුවා නො ඇවිදු මොබ එ'යි වදාළ හැ.''

ඉහත ගද්‍ය පාඨයේ ඇති ''කළකුරුවා'' යන වචනයේ අර්ථය කුමක් ද?

(1) වෙහෙසට පත් කර (2) තුවාල නො කර

(3) හකුළා ගෙන (4) වෙවුලමින්

:(36) පහත සඳහන් කවියේ තුන්වන පද්‍ය පාදය තෝරන්න.

''රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ

පාන්දරට යන්තම් ඇස පියෙන්නේ

.......................................................................

හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ

(1) එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ

(2) හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ

(3) දෙගොඩ හරිය ගෙවිලා පිනි වැටෙන්නේ

(4) දෙගොඩ ගොඩින් නුඹ කොතැන ද සිටින්නේ

(37) A- කුකුළු හැවිල්ල - සැහැලි පද්‍ය

B- හෙයියම් මාරුව - සිරි ගුණසිංහ

C- ඔතෙලෝ - විලියම් ශේක්ෂ්පියර්

D-වතුර මල - ඇරැව්වල නන්දිමිත්‍ර

A B C D ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) B හා C ය. (2) A හා D ය. (3) B හා D ය. (4) A, C හා D ය.

(38) සබරගමු උපභාෂාවේ ''**කුරුවෙ රාජකාරිය''** ලෙස හඳුන්වන්නේ,

(1) හේන් කෙටීම (2) අලි ඇල්ලීම (3) ගොවිතැන් කිරීම (4) ගව පාලනය

(39) ස පෙ ක් එකකු කැව නසිනේ ඔහු ම වද
අ නෙ ක් ලොවින් නො නැසෙයි සතෙකුත් එක ද
ප ස ක් දුදන පබු කන මුව ළං කළ ද
ව ග ක් නැසෙයි වැනසෙයි එමතු ද ඔහු ද

ඉහත කවියෙන් ප්‍රකාශ වන්නේ,

(1) බොරු කීමෙන් වන විනාශය යි. (2) කේලාම් කීමෙන් වන විනාශය යි.

(3) නරක මිතුරන් ඇසුරෙන් වන විනාශය යි. (4) සත්ත්ව හිංසාවෙන් වන විනාශය යි.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් **සමීප අදහස** දෙන වරණය තෝරන්න.

පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනයට වඩා රාජ්‍ය බලය පෙන්වීමේ අවස්ථාවක් වූ බව පැරණි වාර්තා පිරික්සීමේ දී පෙනී යන කරුණකි.

(1) පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනයත් රාජ්‍ය බලය පෙන්වීමත් ප්‍රධාන කොට පවත්වා ඇත.

(2) පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් පවත්වා ඇත.

(3) පැරණි වාර්තාවලට අනුව අතීතයේ දළදා පෙරහැර පවත්වා ඇත්තේ රාජ්‍ය බලය පෙන්වීම සඳහා ය.

(4) පැරණි වාර්තාවලට අනුව දළදා පෙරහැර පවත්වා නැත.

(ල. 40 × 1 = 40 යි)